# අලුත්ගමගේ සයිමන් ද සිල්වාගේ නවකතාවලින් පිළිබිඹු වන තත්කාලීන සමාජ පසුබිම පිළිබඳ අධ්‍යයනයක්

පී. නර්මදා තිලංකා කමලවීර[1]

බ්‍රිතාන්‍ය අධිපත්‍යයට නතු වීමෙහි ප්‍රතිඵල වශයෙන් සිංහල ජන සමාජය ප්‍රබල විපර්යාසයන්ට ලක් වෙමින් පැවති යුගයක අධිරාජ්‍යවාදයට එරෙහි ව ප්‍රගතිශීලී මතවාද ව්‍යාප්ත කිරීමේ අරමුණින් නවකතා මාධ්‍යය හැසිරවූ අලුත්ගමගේ සයිමන් ද සිල්වා ජාතික ව්‍යාපාරයේ පුරෝගාමියකු වශයෙන් හඳුන්වාදිය හැකි ය. මීනා (1905), තෙරීසා ( 1907), අපේ ආගම (1910) යනු ඔහු විසින් රචනා කරන ලද නවකතා ත්‍රිත්වය යි. 'ප්‍රබන්ධ කථා' නමින් හැඳින්වුණු සිංහල නවකතා කලාවේ සමාරම්භක අවධියේ ම ලේඛනයට පිවිසි ඔහුගේ නිර්මාණ ද සමකාලීන සෙසු නවකතාකරුවන්ගේ නිර්මාණ මෙන් ම යුගාවේණික සමාජ අවශ්‍යතා සපුරාලනු පිණිස රචනා වූ බව හඳුනාගත හැකි ය. එබැවින් සාහිත්‍ය සේවයට වඩා සමාජ සේවය අරමුණු කරගනිමින් රචිත ඔහුගේ නවකතාවල තත්කාලීන සමාජ පිළිබිඹුව අනිවාර්ය ලක්ෂණයකි. ඔහු විසින් රචිත නවකතා ත්‍රිත්වය සහ සිංහල 'ප්‍රබන්ධ කථා' කලාවට අදාළ ව ලියවුණු සාහිත්‍යික, ශාස්ත්‍රීය හා පර්යේෂණාත්මක කෘති යන ද්විතීයික මූලාශ්‍රය ඇසුරු කර මේ අධ්‍යයනය සිදු කරන ලදි. මෙහි දී සයිමන් ද සිල්වාගේ නවකතාවලින් ප්‍රකට වන තත්කාලීන සමාජ පසුබිම පූර්ව යටත්විජිත යුගය හා සසඳමින් අධ්‍යයනය කෙරිණි. යුගයේ ප්‍රධාන ධාරාව වන ජාතික ව්‍යාපාරයේ දෘෂ්ටිවාදය ප්‍රතිරාව නංවමින් සිංහල සාම්ප්‍රදායික බෞද්ධ සමාජය අබිබවා විදේශිකයන්ගේ සංකර ප්‍රතිපත්ති කරපින්නාගත් දේශීයයන්ට විදේශීය සංස්කෘතියේ හරසුන් බව සහ දේශීය සංස්කෘතියේ හරවත් බව අවබෝධ කරවමින් තත්කාලීන සමාජය ශෝධනයට ලක් කිරීම සයිමන් ද සිල්වාගේ ඒකායන පරමාර්ථය වූ බව මේ අධ්‍යයනයෙන් හඳුනාගත හැකි විය. ඒ පරමාර්ථය තම නවකතා ත්‍රිත්වය ඇසුරින් සාධනය කරගැනීමේ දී විදේශීය බලාධිකාරයත් සමඟ ලාංකේය සමාජයෙහි ඇති ව තිබූ විවිධ වෙනස්කම් ආශ්‍රය කරගත් තත්කාලීන සමාජගත පිළිබිඹුව සයිමන් ද සිල්වාගේ නවකතා ඇසුරෙන් මනා ව ප්‍රකට වන බව අවිවාදයෙන් කිය හැකි ය.

**ප්‍රමුඛ පද:** සයිමන් ද සිල්වා, ජාතික ව්‍යාපාරය, ප්‍රබන්ධ කථා, පූර්ව යටත්විජිත යුගය

---

[1] සිංහල අධ්‍යයනාංශය